017

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන

හයවන මට්ටම - 2021/2022

අවසාන පරීක්ෂණය 2022

**STU6801-** නව යෞවනයින් පිළිබඳ මනෝවිද්‍යාව

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2022.11.27 වේලාව - ප.ව. 01.30 - ප.ව. 04.30 දක්වා

---

I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. අධ්‍යාපන පද්ධතිය තුළින් වර්තමාන ශ්‍රී ලාංකික නව යෞවනයින්ගේ යහපැවැත්ම පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් වීමට හේතු පහක් (05) දක්වන්න.

02. නව යෞවනයින්ගේ සංවර්ධන අනුපාතයන් එකිනෙකට වෙනස් ය. නව යෞවනයින්ගේ සංවර්ධන අනුපාතවල ඇති වෙනස්කම් ඔවුන්ගේ චිත්තවේගී ගැටළුවලට මඟපෑදිය හැකි ආකාරය උදාහරණයක් මඟින් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලාංකික සන්දර්භයෙන් උදාහරණයක් දක්වමින් නව යොවුන් විය අධ්‍යයනය සඳහා වන සංස්කෘතික-සන්දර්භමය පර්යාලෝකයෙහි ප්‍රධාන අදහස් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ඔබ ඔබේ පාසලෙහි 9C පංතියෙහි පංතිභාර ගුරුවරයා/වරිය යැයි සිතන්න. "නව යෞවනයින් තුළ සෞඛ්‍ය සම්පන්න ආහාර ගැනීමේ පුරුදු සංවර්ධනය කිරීම" පිළිබඳ ව දෙමාපියන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහනකදී ඔබ අවධාරණය කරනු ලබන අංශ දෙකක් (02) කෙටියෙන් සාකච්ඡා කරන්න.

05. නව යෞවනයින්ගේ චින්තනය හා බැඳි "පෞද්ගලික ප්‍රබන්ධය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි උදාහරණයක් මඟින් කෙටියෙන් පැහැදිලි කරන්න.

06. නව යෞවනයින්ට සමවයස් කණ්ඩායම්වල ඇති වැදගත්කම හේතු තුනක් (03) දක්වමින් විභාග කරන්න.

07. එරික් එරික්සන් (1902 – 1994) දක්වා ඇති පරිදි නව යෞවනයින්ගේ පෞරුෂ සංවර්ධනයෙහි ස්වභාවය කෙටියෙන් විස්තර කරන්න.

08. නව යෞවන වියෙහි පසු වන ශිෂ්‍යයින් තුළ ඵලදායී වෘත්තීය ලැදියා සංවර්ධනය සුසාධ්‍ය කිරීම සඳහා ගුරුවරයෙකුට භාවිතා කළ හැකි උපායමාර්ග තුනක් (03) යෝජනා කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## II වන කොටස

09. i. ප්‍රජානන සංවර්ධනය හා සම්බන්ධ "විධිමත් ක්‍රියාකාරිත්වය" යන්නෙන් අදහස් වන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. නව යෞවනයින්ගේ ප්‍රජානන සංවර්ධනයෙහි ලක්ෂණ තුනක් (03) හඳුනා ගෙන ඒවා පූර්ව නව යෞවන වියෙහි පසු වන ළමුන්ගේ ප්‍රජානන ලක්ෂණවලින් වෙනස් වන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 08)

iii. නව යෞවන වියෙහි පසුවන ශිෂ්‍යයින්ගේ ප්‍රජානන සංවර්ධනය සුසාධ්‍ය කිරීම සඳහා ගුරුවරයෙකු විසින් භාවිතා කළ හැකි උපායමාර්ග හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 x 04 = 08)

10. i. "නව යොවුන් විය ඇතැම් විට 'චිත්තවේගීමය කැළඹීම්වලින් යුත් සමයක්' ලෙස හඳුන්වනු ලැබේ."

ඉහත කියමන හේතු දෙකක් (02) ගෙන හැර දක්වමින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 04)

ii. (අ) නව යෞවනයින් විසින් අත්දකිනු ලබන චිත්තවේගී ගැටළු විෂාදය ඇති වීමට මඟ පෑදිය හැක. ඔවුන් විසින් අත්දකිනු ලබන චිත්තවේගී ගැටළුවලින් ඇති විය හැකි වෙනත් ප්‍රතිඵල දෙකක් (02) නම් කරන්න. (ලකුණු 01 x 02 =02)

(ආ) ඔබ ඉහත (අ) යටතේ සඳහන් කළ ප්‍රතිඵලවලින් එකක් (01) පහත දැක්වෙන අංශ ඔස්සේ විශ්ලේෂණය කරන්න:

- අවදානමට ලක් විය හැකි අය
- සුවිශේෂී හේතු
- යම් නව යෞවනයකු අවදානමට ලක් ව ඇත් දැයි හඳුනා ගත හැකි ආකාරය

(ලකුණු 02 x 03 =06)

iii. නව යෞවනයින් හට චිත්තවේගී ගැටළුවලට සාර්ථකව මුහුණ දීමට උපකාර කළ හැකි ආකාරය පිළිබඳව දෙමාපියන් සහ ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා පත්‍රිකාවක් නිර්මාණය කිරීමට ඔබට ඉල්ලීමක් කර ඇතැයි සිතන්න. ඔබ විසින් එහි ඇතුළත් කරනු ලබන සියලුම අන්තර්ගතය ඇතුළත් වන සේ පත්‍රිකාව සැලසුම් කරන්න. මෙම පත්‍රිකාව තුළින් නව යෞවනයින්ට උපකාර කිරීම සඳහා එක් එක් පාර්ශවය (එනම් දෙමාපියන් සහ ගුරුවරුන්) විසින් යොදා ගත හැකි උපාය මාර්ග අවම වශයෙන් තුනක් (03) වත් අවධාරණය කළ යුතු ය. (ලකුණු 08)

11. i. පිළිගත් නිර්වචනයක් උපුටා දක්වමින් පෞරුෂය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. පහත දැක්වෙන ප්‍රධාන අංශ අවධාරණය කරමින් නව යෞවනයින් ගොදුරු විය හැකි පෞරුෂ හා මානසික අක්‍රමතා දෙකක් (02) විස්තර කරන්න:

- එම අක්‍රමතා විද්‍යාමාන වන අයගේ ලක්ෂණ
- එම අක්‍රමතා නිසා නව යෞවනයින් තුළ ඇති විය හැකි ප්‍රතිඵල

(ලකුණු 04 x 02 =08)

iii. ඔබ ඔබේ පාසලේ 10A පංතියෙහි පංතිභාර ගුරුවරයා/වරිය යැයි සිතන්න.

එම පංතියෙහි ශිෂ්‍යයින් යහපත් පෞරුෂයක් සංවර්ධනය කර ගැනීමෙහි ලා එකිනෙකාට උපකාර කර ගැනීමට යොමු කිරීම සඳහා ඔබ විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සැලැස්මක් සකස් කරන්න. ඔබගේ සැලැස්මට පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතුය:

- එකිනෙකාට උපකාර කර ගැනීම සඳහා ශිෂ්‍යයින් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි උපායමාර්ග අවම වශයෙන් හතරක් (04) වත්
- එම එක් එක් උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමෙහි දී ගුරුවරයාගේ/වරුන්ගේ භූමිකාව
- එක් එක් උපායමාර්ගය තුළින් බලාපොරොත්තු වන ඵලය/ඵල (ලකුණු 08)

12. සමාජයීය වටිනාකම් හා ලැදියා නව යෞවනයින්ගේ සංවර්ධනයෙහි වැදගත් අංශයකි.

i. වර්තමාන ශ්‍රී ලාංකික නව යෞවනයින්ගේ විනෝදය හා සම්බන්ධ ලැදියා හතරක් (04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 01 x 04 =04)

ii. "මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ නව යෞවනයින් අතර ගැබ් ගැනීම්වල හා ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පැතිරීමෙහි වැඩි වීමක් දැකිය හැක."

ඉහත සඳහන් සංසිද්ධිවලට හේතු හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02 x 04 =08)

iii. නව යෞවනයින් හට ලිංගිකත්වය, ලිංගික චර්යාව සහ ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ ව ධනාත්මක වටිනාකම් ඉගැන්වීම සඳහා පාසල විසින් ගත හැකි පියවර හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 x 04 =08)

13. i. එක් (01) පෞරුෂ න්‍යායක් තෝරා ගෙන එම න්‍යායෙහි ප්‍රධාන මූලධර්ම දක්වන්න.
(ලකුණු 03)

ii. නව යෞවන වියෙහි පසු වන ශිෂ්‍යයින්ගේ පෞරුෂ සංවර්ධනය සුසාධ්‍ය කිරීම සඳහා එම න්‍යායෙහි මූලධර්ම ගුරුවරයෙකු විසින් යොදා ගත හැකි ආකාර තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 09)

iii. නව යෞවනයින්ගේ පෞරුෂ සංවර්ධනය සුසාධ්‍ය කිරීමෙහි දී ඉහත න්‍යායෙහි සීමා දෙකක් (02) විභාග කර වෙනත් පෞරුෂ න්‍යායන්හි මූලධර්ම අන්තර්ගත කර ගැනීම තුළින් එම ක්‍රියාවලිය පූරණය කළ හැකි ආකාරය කෙටියෙන් සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.